# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone | ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax | ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail | වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: COM/Trans/Gen

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி: / Date: 2021.09.01

අමාත්‍යාංශ/රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

## ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2022

ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ට 2022 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා මාර්ගගත ක්‍රමයට පහසුකම් සලසා ඇති අතර ඒ සඳහා LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco වෙබ් ලිපිනයෙන් ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68/misco ඔස්සේ ද මාර්ගගත ක්‍රමයට පිවිස අයදුම් කල හැක.

02. මෙතෙක් ලැබී ඇති වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සලකා බැලීමේ දී හා ලැබෙන විමසීම් අනුව පහත කරුණු සම්බන්ධයෙන් නිලධාරීන් හට ගැටළු පවතින බව නිරීක්ෂණය වී ඇත.

I. නිලධාරියා විසින් ස්ථාන මාරු අයදුම් කිරීමේදී තම වර්තමාන සේවා ස්ථානය නිසි ලෙස ඇතුලත් නොකිරීම.
II. මේ දක්වා වාර්ෂික හෝ වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලද නිලධාරීන් තම තොරතුරු නිසි ලෙස තොරතුරු පද්ධතියෙහි යාවත්කාලීන නොකිරීම.
III. තම මූලික තොරතුරු පද්ධතියට නිසි ලෙස ඇතුලත් නොකිරීම හේතුවෙන් නිලධාරීන්ට වාර්ෂික ස්ථාන මාරු අයදුම් කල නොහැකිවීම.
IV. ස්ථාන මාරු ලබා ආයතනයෙන් පිටතට ගොස් ඇති නිලධාරීන්, අදාල ආයතන විසින් ආයතන පිවිසුම මඟින් පිවිස Termination ඔස්සේ ආයතනයෙන් ඉවත්කිරීම හේතුවෙන් එම නිලධාරීන්ට පද්ධතිය තුලට පිවිසිය නොහැකි වීම.
V. ආයතන ප්‍රධානියාගේ නිර්දේශ ලබා දීමේ දී සහ අදාල වාර්තා ලබා ගැනීමේ දී පවතින ගැටළු.

03. ඉහත ගැටළු ඇමුණුම 01හි දක්වා ඇති කරුණු අනුව කටයුතු කිරීම තුලින් නිරාකරණය කල හැකි බව කාරුණිකව දන්වා සිටිමි. තවද එම තොරතුරු වාර්ෂික ස්ථාන මාරු සඳහා පමණක් නොව ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ තොරතුරු කළමනාකරණය කිරීමේදී ද අවශ්‍ය වන බැවින්, ඔබ ආයතනයේ නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

04. ඒකාබද්ධ සේවා අංශය වෙතින් සිදු කරන විමසීම් සඳහා මාර්ගගත ක්‍රමය හෝ ඊමේල් යොදා ගත හැකි අතර, මාගේ සමාංක හා 2021/08/19 ලිපියේ දන්වා ඇති විමසීම් තොරතුරු ඔබේ පහසුව සඳහා ඇමුණුම 02හි දක්වා ඇත.

05. පවතින කොවිඩ් වසංගත තත්වය යටතේ වුවද ඒකාබද්ධ සේවා අංශය විසින් සිදු කරන කාර්යයන් කෙරෙහි ඔබ විසින් මෙතෙක් දක්වන ලද ඉමහත් සහයෝගය වෙත ස්තුතිවන්ත වන අතර ඉදිරියේදී ද එම සහයෝගය බලාපොරොත්තු වන බවත් කාරුණිකව දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

## <u>වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම</u>

### 1. <u>නිලධාරියා විසින් ස්ථාන මාරු අයදුම් කිරීමේදී තම වර්තමාන සේවා ස්ථානය නිසි ලෙස ඇතුලත් නොකිරීම</u>

නිලධාරියා විසින් තම වර්තමාන සේවා ස්ථානය ඇතුලත් කල යුත්තේ මූලික තොරතුරු වල වන අතර, ඒ සඳහා Personal------personal information------add new employee-----employment details යන මාර්ගය අනුගමනය කල යුතු වේ. සැමවිටම තමා සේවය කරන සේවා ස්ථානයම වර්තමාන සේවා ස්ථානය ලෙස දැන්විය යුතු අතර, උප කාර්යාල වල සේවය කරන නිලධාරීන් ප්‍රධාන කාර්යාලය තම සේවා ස්ථානය ලෙස දැක්වීමෙන් වැලකිය යුතුය (උදා - මාතර කම්කරු කාර්යාලයේ සේවය කරන නිලධාරියෙකු තම සේවා ස්ථානය ලෙස දැක්විය යුත්තේ මාතර කම්කරු කාර්යාලය වන අතර කම්කරු දෙපාර්තමේන්තුව ලෙස දැක්වීම නොකල යුතු වේ).

### 2. <u>වාර්ෂික හෝ වාර්ෂික නොවන ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු ලද නිලධාරීන් ඒ සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීන නොකිරීම</u>

ස්ථාන මාරු ලබා දීමේදී මෙන්ම ඉදිරියේදී ඇතිවන පුරප්පාඩු පිරවීමේද නිලධාරීන්ගේ ස්ථානගත වීම පිළිබඳ නිවැරදි තොරතුරු අවශ්‍ය වන බැවින් ස්ථාන මාරු වීම් හේතුවෙන් තම සේවා ස්ථානය වෙනස් වූ සියළු නිලධාරීන් ඒ සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීන කල යුතු වේ. වාර්ෂික ස්ථාන මාරු වීම් ලද නිලධාරීන්ට මෙය MISCO දත්ත පද්ධතිය ඔස්සේ සිදු කිරීමට පහසුකම් සලසා තිබුණද එය නිසියාකාරව සිදු නොවන බව නිරීක්ෂණය වේ. තවද ඒකාබද්ධ සේවා අංශය විසින් වාර්ෂික නොවන ස්ථාන මාරු මාර්ගගත ක්‍රමයට සිදු කිරීම මෑතදී ඇරඹූ බැවින් මේ සඳහා පහත පරිදි කටයුතු කරන ලෙස ඔබ ආයතනයේ නිලධාරීන්ට දැනුම් දීම මැනවි.

I. පෙර 1 හි දැක්වූ පරිදි මූලික තොරතුරු හි තම වර්තමාන සේවා ස්ථානය යාවත්කාලීන කිරීම

II. මෙනුවෙහි Service යන්න තෝරා Service----Service-----History-----Transfer History යන මාර්ගය ඔස්සේ ගොස් පෙර සේවා ස්ථානයේ සේවා කාලය යාවත්කාලීන කිරීම

### <u>03. මූලික තොරතුරු සියල්ල ඇතුලත් කිරීම අනිවාර්යය වේ</u>

Add new Employee හි දක්වා ඇති සියළු තොරතුරු ඇතුලත් කිරීම අනිවාර්යය වන අතර, තමාට අදාල නොවන ඇතැම් කරුණු උදා - New NIC යන්නට ( - ) හෝ යෙදිය යුතු වේ. එමෙන්ම තොරතුරු ඇතුලත් කර සුරැකීමට යාමේදී (save) එය කල නොහැකි බව දන්වයි නම්, අඩුපාඩු ඇති ස්ථානයන්හි නිල් පාටින් අදාල කරුණ පෙන්වා දෙයි. අදාල වැරදි නිවැරදි කර නැවත සුරැකීම සිදු කිරීම තුලින් නිලධාරියාට තම තොරතුරු පහසුවෙන් දත්ත පද්ධතියට ඇතුලත් කරගත හැකි වේ.

### <u>04. ආයතනයෙන් ස්ථාන මාරු ලැබූ නිලධාරීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම</u>

I. ස්ථාන මාරු ලබා ආයතනයෙන් පිටතට ගොස් ඇති නිලධාරීන් ඉහත 2 පරිදි තොරතුරු යාවත්කාලීන කිරීම තුලින් පමණක් තම ආයතනය තුලින් ඉවත්කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටින අතර, ඇතැම් ආයතන විසින් ආයතන පිවිසුම ඔස්සේ පිවිස මෙනුවෙහි Service----Termination ඔස්සේ නිලධාරීන් තම ආයතනයෙන් ඉවත්කිරීම සිදු කරන බව නිරීක්ෂණය වී ඇත. මෙසේ Termination ඔස්සේ නිලධාරියා ඉවත් කිරීම සිදු කල යුත්තේ විශ්‍රාම යාම, ඉල්ලා අස්වීම හා මුදා හැරීම් යනාදිය මගින් සේවය අවසන් කිරීමක් සිදුව ඇත්නම් පමණක් වන බව කාරුණිකව සිහිපත් කරමි.

II. <u>නිලධාරියෙකුගේ සේවය අවසන් කර ඇත්නම් පමණක් පහත මාර්ගය ඔස්සේ නිලධාරියා ආයතනයෙන් ඉවත් කිරීමට කටයුතු කල යුතු වේ.</u>

Service----Termination-----Details-----අදාල අතුරු මුහුණතේ ඇති Text Box තුල නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කර Find Employee Button Click කරන්න. නිලධාරියාගේ තොරතුරු දිස්වූ පසු Termination Button Click කරන්න. එවිට දිස්වන අතුරු මුහුනතේ අදාල තොරතුරු ඇතුලත් කර Direct Terminate Button Click කරන්න. එවිට නිලධාරියා අදාල සේවාවෙන් ඉවත් වේ.

## 05. ආයතන ප්‍රධානියාගේ නිර්දේශ ලබා දීම සහ අදාල වාර්තා ලබා ගැනීම

I. නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සඳහා මෙන්ම අනෙකුත් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා, පුරප්පාඩු යාවත්කාලීන කිරීම ආදී අනෙකුත් සියළු කටයුතු සඳහා LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://10.250.1.112/misco වෙබ් ලිපිනයෙන් ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68/misco/ ඔස්සේ ආයතනික පිවිසුම තුලින් MISCO යෙදවුම තුලට ඇතුලත් විය හැක.

II. නිලධාරීන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් සඳහා ආයතන ප්‍රධානියාගේ නිර්දේශ ලබා දීම සඳහා ආයතනික පිවිසුම ඔස්සේ පද්ධතියට ඇතුලත්ව මෙනුවෙහි Transfer----Entry----Recommendation(T) යන මාර්ගය අනුගමනය කල යුතු වේ. අදාල නිලධාරියා තෝරා Officer Recommendation හි තම නිර්දේශය දක්වා Add Decision Button ක්ලික් කරන්න. මේ සඳහා හේතු දැක්වීම් හෝ වෙනත් කරුණු ඇතුලත් කල යුතු නම් Reason සහ Remarks හි දැක්විය හැකි අතර, එවිට අදාල Field සියල්ල දැක්වීමෙන් අනතුරුව Add Decision Button ක්ලික් කල යුතු වේ. එමගින් නිලධාරීන් සඳහා නිර්දේශ ලබා දිය හැකි වේ.

III. වාර්ෂික ස්ථාන මාරු සඳහා ඒකාබද්ධ සේවා අංශය වෙත එවිය යුතු **වසර 05 කට වැඩි කලක් එකම සේවා ස්ථානයේ සේවය කල නිලධාරීන් හා ස්ථාන මාරු අයදුම් කල නිලධාරීන්ගේ ලැයිස්තුව ලබා ගැනීම සඳහා,** සඳහා LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://10.250.1.112:7000 වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68:7000 **යන වෙබ් ලිපිනය පමණක් භාවිතා කල යුතු වේ**. මේ සඳහා ආයතන පිවිසුම ඔස්සේ පිවිස මෙනුවෙහි Transfer-----Reports-----Schedule I (5 List) ඔස්සේ ලබා ගත හැකි අතර එහි දෘඩ පිටපත ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කල යුතු වේ. මෙසේම Schedule II (5 List) ඔස්සේ තම ආයතනයේ නිලධාරීන්ගේ තොරතුරු පහසුවෙන් බලා ගත හැකි වන අතර තොරතුරු පරීක්ෂා කිරීම ඒ තුලින් සිදු කිරීම පහසු වේ.

ඇමුණුම 02

**ඒකාබද්ධ සේවා අංශය වෙතින් සිදු කරන විමසීම් සඳහා**

1. **මාර්ගගත ක්‍රමයට**

   LGN ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේනම් http://10.250.1.112/misco වෙබ් ලිපිනයෙන්ද වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගන්නේ නම් http://43.224.125.68/misco/ ඔස්සේ ද පද්ධතියට ඇතුලත්ව එහි මෙනුවෙහි ඇති CS Inquiry ඔස්සේ තම විමසීම් එහි දර්ශකයේ (Index ) දක්වා ඇති පරිදි අදාල අංශ වෙත යොමු කල හැක

2. **ඊමේල් ඔස්සේ**

| තනතුර | ඊමේල් ලිපිනය |
|---|---|
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | dgcs.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ I (කළමනාකරණ සේවා නිලධාරී සේවය) | dcs1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ II (බඳවාගැනීම් හා විභාග, විනය හා ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) | dcs2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ III (කාර්යාල සේවක සේවාව, රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය, ඒකාබද්ධ රියදුරු සේවය | dcs3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ IV (සංවර්ධන නිලධාරී සේවය) | dcs4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය I ශ්‍රේණිය) | adcs1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය II ශ්‍රේණිය) | adcs2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය III ශ්‍රේණිය) | adcs3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය-ස්ථානමාරු හා අධි ශ්‍රේණිය) | ddcs4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කාර්යාල සේවක සේවාව) | adcs5.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (රජයේ භාෂා පරිවර්තක සේවය,<br>ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය, ඒකාබද්ධ රියදුරු සේවය) | adcs6.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) | ddcs7.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරී සේවය-ස්ථාන මාරු) | adcsdos1.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරී සේවය-ස්ථිර කිරීම්) | adcsdos2.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරී සේවය-උසස් කිරීම්) | adcsdos3.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරී සේවය-ස්ථිර කිරීම්) | adcsdos4.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන නිලධාරී සේවය-ප්‍රතිපත්ති හා අන්තර්ග්‍රහණ) | adcsdos5.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (බඳවාගැනීම් සහ විභාග ශාඛාව) | adcs.rec.pubad@gmail.com |
| ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (විනය ශාඛාව) | adcs.disc.pubad@gmail.com |
| පරිපාලන නිලධාරි (පාලන ශාඛාව) | aocs.pubad@gmail.com |
| PACIS මුරපද ලබා ගැනීම හා මාර්ගගතව ස්ථාන මාරු ඇතුලත් කිරීමේ ගැටළු පිලිබඳව | cspacis2021@gmail.com |